**මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතිය - 2024**

**------------------------------------------------------**

මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළඹි අංක 3585 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V (ඕ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සුළං බලශක්ති ජනන ධාරිතාව වැඩි කිරීම, පද්ධති ප්‍රතික්‍රියාශීලී බලශක්ති කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘති ඉංජිනේරු සැලසුම් සමාලෝචනය සහ අධීක්ෂණය තුළ ණය ගැනුම්කරුගේ ධාරිතාව ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ පිවිතුරු බලශක්ති ජනනය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ.ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ සංශෝධිත ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 33,702.09 කට සමාන වූ එජඩො මිලියන 216.70 වන අතර ඉන් රු. මිලියන 24,883.87 කට සමාන වූ එජඩො මිලියන 160ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 8,818.22 කට සමාන වූ එජඩො මිලියන 56.70 ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2018 පෙබරවාරි 22 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2026 ජුනි 30දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.1 ඡේදයෙන් විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සුළං බලාගාරයේ හානි වූ තල 04 ක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරන ලද රු.මිලියන 1,024.23ක මුදල ශ්‍රී.ල.ගි.ප්‍ර 16 අනුව අදාළ වත්කම්වල ප්‍රාග්ධනීකරණය කිරීම | එම මුදල මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණයගැතියන් ලෙස හඳුනාගෙන ඇත. | ශ්‍රී.ලං.ගි.ප්‍ර වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ණයගැතියන් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) | කෙරීගෙන යන වැඩ යටතේ ඇතුළත් රු. මිලියන 324.48ක ප්‍රාග්ධන වියදම් ශේෂය සහ රු. මිලියන 297.73 ක කොන්ත්‍රාත්කරුගේ ශේෂය සඳහා උපලේඛන සහ උපකාරක ලියවිලි වැනි තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. එබැවින්, රු. මිලියන 622.21 ක ශේෂයන් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | අදහස ඉදිරිපත් කර නොමැත. | ශේෂයන් සත්‍යාපනය කිරීම සඳහා අදාළ උපලේඛන සහ උපකාරක ලියවිලි ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ණය ගිවිසුමට අනුව, (අ) සුළං බල උත්පාදන ධාරිතාව වැඩි කිරීම (ආ) වැඩිදියුණු කළ පද්ධති ප්‍රතික්‍රියාශීලී බල කළමනාකරණය සහ (ඇ) ව්‍යාපෘති ඉංජිනේරු සැලසුම් සමාලෝචනය සහ ලංකා විදුලිබල මණ්ඩලයට අධීක්ෂණ සහාය ලෙස හැඳින්වෙන ප්‍රධාන නිමැවුම් 03, 2024 දෙසැම්බර් 31 වන විට අවසන් කර තිබුණි. කෙසේවෙතත්, පද්ධති ප්‍රතික්‍රියාශීලී බල කළමනාකරණය යටතේ ඉදිකරන ලද වත්කම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රාග්ධනිත කර නොතිබුණි. තවද, මන්නාරම සුළං බල ව්‍යාපෘතිය - අදියර I යටතේ තල 4 ක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා මණ්ඩලය විසින් 2023 දී දරන ලද රු. මිලියන 1,024.23 කට සමාන එ.ජ.ඩො මිලියන 3.02 ක පිරිවැය අයකර ගැනීමේ සහ ප්‍රධාන EPC කොන්ත්‍රාත්කරු විසින් රේඩාර් මත පදනම් වූ කුරුල්ලන් හඳුනාගැනීමේ පද්ධතිය ප්‍රතිසංස්කරණය නොකිරීම සම්බන්ධයෙන් ගැටළු සමාලෝචිත වර්ෂය අවසානය වන විට විසඳී නොතිබුණි. | දීර්ඝ කිරීම මඟින් ව්‍යාපෘති කණ්ඩායමට සියලු නිමවුම් සහ ප්‍රතිදානයන් අවසන් කිරීමට අවශ්‍ය කාල ලබාදේ. ඒ අනුව, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කරමින්,සංශෝධිත ණය අවසන් දිනයට පෙර සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘති කාලය තුළ ගැටළු විසඳා ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

**3.2 අරමුදල් උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ණය මුදල යටතේ වෙන් කරන ලද එ.ජ.ඩො මිලියන 160ක මුදලින්, 2024 දෙසැම්බර් 31 වන විට එ.ජ.ඩො මිලියන 151.84කට සමාන | අරමුදල් වියපැහැදම් කිරීම සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් හෝ අක්‍රමිකතාවයක් නොමැත. | ණය මුදල් කාර්යක්ෂමව භාවිත කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 31,509.26ක් උපයෝජනය කර තිබුණු අතර, 2024 වර්ෂය අවසන් වන විට එ.ජ.ඩො මිලියන 8.16ක් ලබා ගැනීමට නියමිතව තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කරන ලද එ.ජ.ඩො මිලියන 8.91කට සමාන රු. මිලියන 2,757.30 කින්, ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ලබා ගැනීමෙන් පසු, ලංකා විදුලිබල මණ්ඩලයේ අනෙක් අංශය විසින් සම්ප්‍රේෂණ මාර්ග ජාලවලට අවශ්‍ය ද්‍රව්‍ය/උපකරණ ප්‍රසම්පාදනය සඳහා එ.ජ.ඩො මිලියන 7.98කට සමාන රු. මිලියන 2,469.88ක් උපයෝජනය කර තිබුණි. | | |
| (ආ) | ණය මුදල වෙන් කිරීම අනුව, පොලී සහ බැඳීම් ගාස්තු සඳහා එ.ජ.ඩො මිලියන 12.40ක මුදලක් වෙන් කර ඇති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට සියලුම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම භාවිත තිබුණි. ඉන්, ණය මුදල් වියපැහැදම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 දිනට ලං.වි.ම විසින් වර්ෂය තුළ දරන ලද රු. මිලියන 3.08ක් ඇතුළුව රු. මිලියන 200.03 කට සමාන එ.ජ.ඩො 989,767.45 ක මුදලක් බැඳීම් ගාස්තු ලෙස දරා තිබුණි. තවද, භාවිතයට නොගත් අයවැය වෙන් කිරීම සඳහා දරන ලද බැඳීම් ගාස්තුව අනාර්ථික බව නිරීක්ෂණය විය. වියපැහැදම් නොකළ ණය ප්‍රමාණයන් සඳහා අනාගතයේදී පනවන ලද බැඳීම් ගාස්තු ලං.වි.ම අරමුදල්වලින් දැරීමට සිදුවනු ඇත. එබැවින්, එය ලං.වි.ම සඳහා අමතර බරක් වනු ඇත. | විවිධ අනපේක්ෂිත සහ නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇත. ව්‍යාපෘති දිගු කිරීම් ලබා දෙනු ලබන්නේ වලංගු සහ සාධාරණ හේතු මත පමණි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ණය මුදල් භාවිත කිරීමට පියවර ගත යුතුය. |

**3.3 පද්ධති හා පාලනයන්**

| **විගණන නිරීක්ෂණය** | **කළමණාකරණයේ අදහස් දැක්වීම්** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|
| 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2010(05) ට අනුව, ව්‍යාපෘතියට අදාළ අභ්‍යන්තර විගණන කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ශාඛාව තුළ ඇති සීමිත සම්පත් හේතුවෙන්, සියලුම ව්‍යාපෘති වාර්ෂිකව විගණනය කිරීම කළ නොහැකි ය. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |